# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2121/44 - 2019 මැයි මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2019.05.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

25අ වැනි වගන්තිය යටතේ නියමය

එල්.ඩී.බී. 21/1978(x)(A)

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී.වී.101137 දරන සමාගමක් වන එස්.එල්.ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසුව, මෙම නියමය මඟින්, මේ පනත යටතේ සාදන ලද සහ 2019 ජනවාරි මස 09 දින අංක 2105/31 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසි වලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන " තොරතුරු සහ සන්නිවේදන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිවම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මඟින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

I වන උපලේඛනය

***කොන්දේසි***

එස්.එල්.ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අලෙවි කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව, සැපයුම් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව, මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව, ගිණුම්කරණය හා මූල්‍ය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය යන උපාධි පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේදී :-

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ වාණිජ්‍ය විද්‍යා විෂයය ධාරාවෙන් 'සාමාන්‍ය සාමාර්ථ' (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම; හෝ

(ආ) නිශ්චිත බලධරයා විසින් පිළිගත් පදනම් පාඨමාලාවක් සමඟ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ කවර හෝ විෂයය ධාරාවක් යටතේ 'සාමාන්‍ය සාමාර්ථ' (S) තුනක් (3) එකවර ලබා තිබීම

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

*II වන උපලේඛනය*

| *I වන තීරය*<br><br>උපාධිය | *II වන තීරය*<br><br>උපාධිය සඳහා වන කෙටි යෙදුම |
|---|---|
| අලෙවි කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව | බී බී එම් ජී ටී ගෞරව (අලෙවි කළමනාකරණය) |
| සැපයුම් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව | බී බී එම් ජී ටී ගෞරව (සැපයුම්දාම කළමනාකරණය) |
| මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව | බී බී එම් ජී ටී ගෞරව (මෙහෙයුම් කළමනාකරණය) |
| ගිණුම්කරණය හා මූල්‍ය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව | බී බී එම් ජී ටී ගෞරව (ගිණුම්කරණය හා මූල්‍ය) |
| මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව | බී බී එම් ජී ටී ගෞරව (මානව සම්පත් කළමනාකරණය) |

අ. ඉබතුල් රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජලසම්පාදන හා උසස්
අධ්‍යාපන අමාත්‍ය.

2019 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹදී ය.

05 - 318

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.